රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක :- 312

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
ඒකාබද්ධ සේවා අංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1985 නොවැම්බර් මස 18 වැනි දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

අධ්‍යයන නිවාඩු
<u>ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය</u>

ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ නිලධාරියෙකුට සම්පූර්ණ වැටුප් සහිත දින 10 ක (දහයක) අධ්‍යයන නිවාඩු 03 වන ඡේදයේ දක්වා ඇති විභාගයකට පෙනී සිටීම පිණිස දිය යුතුයි.

2. මෙම නිවාඩු

(අ) විභාගය පටන් ගන්නා දිනට පූර්වාසන්න වූ මාසය තුල ලබා ගත යුතුය.

(ආ) සඳහා අරමුණ ඔප්පු කිරීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(ඇ) අනුමත කිරීම දෙපාර්තමේන්තු ප්‍රධානියා කළ යුතුය.

3. (1) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ,

ආධුනික විභාගය
ආශ්‍රිත සාමාජිකත්ව 1 වන කොටස
ආශ්‍රිත සාමාජිකත්ව 11 වන කොටස

(11) ලංඩන් පිරිවැය සහ කළමණාකාරිත්ව ගණකාධිකාරි ආයතනයේ,

වෘත්තිය 1 වන කොටස
වෘත්තිය 11 වන කොටස
වෘත්තිය 111 වන කොටස

(111) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ තෘතීයික විද්‍යාලයීය ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා -

තුන්වන වසර
හතරවන වසර

Siriwardhana

(ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

මසි/-